# (21) ආර්ථික විද්‍යාව

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

**I පත්‍රය** - **කාලය : පැය 02යි.**

වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **50කි.** ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100කි.**

**II පත්‍රය** - **කාලය : පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10යි.)
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත වේ.

'අ' උප කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **පහකි.**
'ආ' උප කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **පහකි.**

අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **20** බැගින් **මුළු ලකුණු 100කි.**

අවසාන ලකුණ ගණනය කිරීම :

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 100 |
| II පත්‍රය | = | 100 |
| අවසාන ලකුණ | = | 200 ÷ 2 = 100 |

**I පත්‍රය**

**සැලකිය යුතුයි :**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න (විභාගයේ දී පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ.)

---

**1.** හිඟකම පිළිබඳ සංකල්පය පැහැදිලි කිරීමේ දී වඩාත් යෝග්‍ය ප්‍රකාශය කුමක් ද?

(1) හිඟකම යනු වෙළෙඳපොළේ ඇතැම් භාණ්ඩවල හිඟයක් දක්නට ලැබීමය.
(2) හිඟකම යනු අඩු ආදායම්ලාභී රටවල් පමණක් මුහුණ දෙන ගැටලුවකි.
(3) හිඟකම යනු පවත්නා සම්පත්වලින් මිනිස් වුවමනා සපුරා ගත නො හැකි තත්ත්වයකි.
(4) වෙළෙඳපොළ යන්ත්‍රණය මත රඳා පවත්නා රටවල හිඟකම පිළිබඳ ප්‍රශ්නය දක්නට නො ලැබේ.
(5) ආර්ථික වෘද්ධිය නිසා හිඟකම තුරන් වී යනු ඇත.


**2.** පහත සඳහන් ඒ අතුරින් කවරක් මානව ප්‍රාග්ධනය ලෙස සැලකිය හැකි ද?

(1) ප්‍රාග්ධන උපකරණ නිපදවීම සඳහා යොදාගත් ශ්‍රම සම්පත්
(2) ආර්ථිකයේ අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයන්හි රජය කරනු ලබන ආයෝජන
(3) ව්‍යවසායකයකුගේ අවදානම් දැරීමේ හැකියාව
(4) ශ්‍රම හමුදාවේ දැනුම, කුසලතා සහ අත්දැකීම් සම්භාරය
(5) අධි තාක්ෂණික වෘත්තීන්හි නියුතු ශ්‍රම හමුදාව

**3.** වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක මිලෙහි ප්‍රධාන කාර්යයක් වන්නේ,

(1) ආර්ථිකය පූර්ණ සේවා නියුක්තිය කරා රැගෙන යාමයි.
(2) ආර්ථික විෂමතා අවම කිරීමයි.
(3) තරගකාරී නිෂ්පාදන ක්ෂේත්‍ර අතර හිඟ සම්පත් සලාකනය කිරීමයි.
(4) සුඛෝපභෝගී භාණ්ඩ නිෂ්පාදනය අධෛර්යමත් කිරීමයි.
(5) නිෂ්පාදන හා පරිභෝජන ක්‍රියාවන්හි දී හට ගන්නා බාහිරතා ඉවත් කිරීමයි.

4. පහත සඳහන් රූප සටහන ආර්ථිකයක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පෙන්වයි.




මෙම ආර්ථිකය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශයක් නිවැරදි වේ ද?

(1) A ලක්ෂ්‍යයේ සිට B ලක්ෂ්‍යය කරා ගමන් කිරීමේදී අඩුවන ආවස්ථික පිරිවැය පෙන්නුම් කෙරේ.
(2) F ලක්ෂ්‍යයේ සිට B ලක්ෂ්‍යය කරා ගමන් කිරීමට සහල් නිෂ්පාදනය සඳහා නව තාක්ෂණය යොදා ගැනීම අවශ්‍ය වේ.
(3) F ලක්ෂ්‍යයේ සිට B ලක්ෂ්‍යය කරා ගමන් කිරීම සහල් ආනයනය ශීඝ්‍ර ලෙස ඉහළ යාම නිසා සිදු වේ.
(4) A ලක්ෂ්‍යයෙහි සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව පැවතිය හැකි වුවද නිෂ්පාදන කාර්යක්ෂමතාව නොපවතී.
(5) B ලක්ෂ්‍යයෙහි නිෂ්පාදන කාර්යක්ෂමතාව පැවතියත් සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව නොපැවතිය හැකිය.

5. පහත සඳහන් ප්‍රකාශ අතුරින් කවර ප්‍රකාශයක් නිවැරදි වේද?

(1) ඉල්ලුම් වක්‍රය මත කිසියම් ලක්ෂ්‍යයක් ඉල්ලුම නිරූපණය කරයි.
(2) ඉල්ලුම් වක්‍රය මත ලක්ෂ්‍යයන් අතර ගමන් කිරීම ඉල්ලුම වෙනස්වීම නිරූපණය කරයි.
(3) ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වීම ඉල්ලුම් ප්‍රසාරණය නිරූපණය කරයි.
(4) ඉල්ලුම් වක්‍රය වමට විතැන් වීම ඉල්ලුම් සංකෝචනය නිරූපණය කරයි.
(5) ඉල්ලුම් වක්‍රය මත ලක්ෂ්‍යයන් අතර ගමන් කිරීම ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වෙනස් වීම නිරූපණය කරයි.

6. බටර් සඳහා ඇති වෙළෙඳපොළ සැපයුම් වක්‍රය නිරූපණය කෙරෙන සමීකරණය, $Q_{S1} = -200 + 10P$ සිට $Q_{S2} = -100 + 10P$ දක්වා වෙනස් වීමට හේතුව,

(1) බටර් සඳහා වෙළෙඳපොළ මිල ඉහළ යාමකි.
(2) කිරි මිල ඉහළ යාමකි.
(3) බටර් නිෂ්පාදකයින්ට සහනාධාරයක් ලබා දීමකි.
(4) බටර් මත නිෂ්පාදන බද්දක් පැනවීමකි.
(5) කුටුම්බ ආදායම ඉහළ යාමකි.

7. සීනි සඳහා ඉල්ලුමේ මිල නම්‍යතාව එකට වඩා අඩු යැයි සලකන්න. සීනි නිෂ්පාදනය මත නිෂ්පාදන බද්දක් පැනවූ විට මිල, ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය හා පාරිභෝගික පැහැදම පහත සඳහන් කවර ආකාරයෙන් වෙනස් වේද?

| | මිල | ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය | පාරිභෝගික පැහැදම |
|---|---|---|---|
| (1) | අඩු වේ. | වැඩි වේ. | වැඩි වේ. |
| (2) | අඩු වේ. | අඩු වේ. | අඩු වේ. |
| (3) | වැඩි වේ. | අඩු වේ. | අඩු වේ. |
| (4) | වැඩි වේ. | අඩු වේ. | වැඩි වේ. |
| (5) | වැඩි වේ. | වැඩි වේ. | වැඩි වේ. |

**8.** එක්තරා භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත සඳහන් සමීකරණ විස්තර කරයි.

$Q_D = 400 - 7P$ (ඉල්ලුම) $Q_S = -100 + 3P$ (සැපයුම)

වෙළෙඳපොළ සමතුලිතයේ දී භාණ්ඩයේ මිල සහ මුළු අයභාරය කොපමණ ද?

| | සමතුලිත මිල (රුපියල්) | මුළු අයභාරය (රුපියල්) |
|---|---|---|
| (1) | 30 | 1500 |
| (2) | 30 | 2000 |
| (3) | 50 | 2400 |
| (4) | 50 | 2500 |
| (5) | 65 | 3500 |

**9.** ඉල්ලුම හා සැපයුම යන දෙකම ඉහළ ගිය හොත්,

(1) සමතුලිත මිල ඉහළ නගින අතර සමතුලිත ප්‍රමාණය වැඩි වේ.
(2) සමතුලිත මිල පහළ බසින අතර සමතුලිත ප්‍රමාණය වැඩි වේ.
(3) සමතුලිත මිල ඉහළ හෝ පහළ හෝ යා හැකි නමුදු සමතුලිත ප්‍රමාණය වැඩි වේ.
(4) සමතුලිත මිල ඉහළ නගින අතර සමතුලිත ප්‍රමාණය වැඩි හෝ අඩු වේ.
(5) සමතුලිත මිල පහළ බසින අතර සමතුලිත ප්‍රමාණය වැඩි හෝ අඩු වේ.


**10.** එක්තරා වගා කන්නයක දී ගොවීන්ගේ අස්වැන්න ඉහළ ගිය ද ඔවුන්ගේ අලෙවි ආදායම පහළ වැටුණි. පහත සඳහන් කවර තත්ත්වයක් මේ සඳහා බලපානු ලැබුවේ ද?

(1) අනම්‍ය ඉල්ලුම හා නම්‍ය සැපයුම
(2) නම්‍ය ඉල්ලුම හා අනම්‍ය සැපයුම
(3) අනම්‍ය ඉල්ලුම හා අනම්‍ය සැපයුම
(4) පූර්ණ නම්‍ය ඉල්ලුම හා අනම්‍ය සැපයුම
(5) නම්‍ය ඉල්ලුම හා පූර්ණ නම්‍ය සැපයුම

**11.** තරගකාරී වෙළෙඳපොළක අලෙවි වන සාමාන්‍ය භාණ්ඩයක් සඳහා රජය විසින් ඒකක සහනාධාරයක් එම භාණ්ඩයේ නිෂ්පාදකයන් වෙත ලබා දීමට තීරණය කොට ඇතැයි සලකන්න. සහනාධාරයෙන් පසු පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය මත ඇතිවන බලපෑම කවරක්වේ ද?

| | නිෂ්පාදක අතිරික්තය | පාරිභෝගික අතිරික්තය |
|---|---|---|
| (1) | අඩු වේ | අඩු වේ |
| (2) | වැඩි වේ | වැඩි වේ |
| (3) | අඩු වේ | වැඩි වේ |
| (4) | අඩු වේ | වෙනස් නො වේ |
| (5) | වෙනස් නො වේ | අඩු වේ |

**12.** ලොකු ළූණු වෙළෙඳපොළේ කෙටි කාලීන ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත රූප සටහනෙහි පෙන්නුම් කෙරේ.




රජය විසින් ලොකු ළූණු සඳහා කිලෝ ග්‍රෑම් මිලියන 40ක කෝටාවක් (Quota) ලොකු ළූණු වගා කරන ගොවීන් සඳහා නියම කරනු ලැබුවහොත්, ලොකු ළූණු කිලෝ ග්‍රෑමයක් සඳහා වෙළෙඳපොළ සමතුලිත මිල කොපමණ ද?

(1) රුපියල් 150
(2) රුපියල් 100
(3) රුපියල් 50
(4) රුපියල් 50 ට වඩා අඩු වේ.
(5) රුපියල් 100 ට වඩා අඩු වේ.

**13.** එක්තරා කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා වාර්ෂික ඉල්ලුම් හා සැපයුම් ලේඛන පහත වගුවේ දැක්වේ.

| මිල (කිලෝ ග්‍රෑමයක් රුපියල්) | ඉල්ලුම් ප්‍රමාණය (කිලෝ ග්‍රෑම් මිලියන) | සැපයුම් ප්‍රමාණය (කිලෝ ග්‍රෑම් මිලියන) |
|---|---|---|
| 40 | 30 | 10 |
| 50 | 25 | 15 |
| 60 | 20 | 20 |
| 70 | 15 | 25 |
| 80 | 10 | 30 |

මෙම වෙළෙඳපොළට මැදිහත් වීම මගින් රු. 70ක අවම මිලක් සඵලදායීව පවත්වාගෙන යාමට රජය කටයුතු කරයි. එවැනි ක්‍රියාවක් නිසා රජයට වාර්ෂිකව දරන්නට සිදුවන පිරිවැය රුපියල් මිලියන,

(1) 700ක් වේ. (2) 950ක් වේ. (3) 1,050ක් වේ.
(4) 1,300ක් වේ. (5) 1,700ක් වේ.

**14.** කිසියම් නිෂ්පාදන සාධකයක සමස්ත ඉපැයුම, ආර්ථික බදු කුලියෙන් පමණක් සමන්විත වන්නේ එම සාධකයේ සැපයුම,

(1) පූර්ණ අනම්‍ය වන විට ය. (2) පූර්ණ නම්‍ය වන විට ය. (3) ඒකීය නම්‍ය වන විට ය.
(4) නම්‍ය වන විට ය. (5) අනම්‍ය වන විට ය.

**15.** ශ්‍රමයේ ආන්තික නිෂ්පාදිතය (MP), ශ්‍රමයේ සාමාන්‍ය නිෂ්පාදිතයට (AP) ට සමාන වන විට,

(1) ශ්‍රමයේ ආන්තික නිෂ්පාදිතය උපරිම වේ.
(2) නිෂ්පාදනයේ ආන්තික පිරිවැය අවම වේ.
(3) ආන්තික පිරිවැය, අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) ට සමාන වේ.
(4) සාමාන්‍ය මුළු පිරිවැය (ATC) අවම වේ.
(5) ශ්‍රමයේ මුළු නිෂ්පාදිතය උපරිම වේ.

**16.** කෙටි කාලයේ දී නිෂ්පාදන ආයතනයක් විචල්‍ය යෙදවුම් වැඩි කරමින් නිමැවුම ප්‍රසාරණය කරන විට, එහි සාමාන්‍ය මුළු පිරිවැය (ATC) වක්‍රය සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයට වඩාත් ළං වන්නේ, නිමැවුම ප්‍රසාරණය කරන විට

(1) මුළු පිරිවැය (TC) වැඩිවන නිසා ය.
(2) මුළු පිරිවැය (TC) අඩුවන නිසා ය.
(3) සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC) අඩු වන නිසා ය.
(4) සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) අඩුවන නිසා ය.
(5) ආන්තික පිරිවැය (MC) වැඩි වන නිසා ය.

**17.** කෙටි කාලයේ දී පූර්ණ තරගකාරී ආයතනයක ලාභ උපරිම කෙරෙන නිමැවුම් මට්ටම ඒකක 500ක් ද, වෙළෙඳපොළ සමතුලිත මිල රු. 20ක් බව ද, උපකල්පනය කරන්න. මෙම නිෂ්පාදන මට්ටමේ දී ආයතනය රු. 2,000ක ආර්ථික ලාභයක් උපයයි. සමතුලිත නිමැවුම් මට්ටමේ දී ආයතනයේ සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC) රු. 4ක් නම් නිෂ්පාදක අතිරික්තය රුපියල්,

(1) 4,000 කි. (2) 6,000 කි. (3) 8,000 කි.
(4) 10,000 කි. (5) 12,000 කි.

**18.** ජාතික ගිණුම්කරණයේ දී මූලික මිල යටතේ දළ එකතු කළ අගය (GVA) ලෙස සැලකෙන්නේ,

(1) ආර්ථික ප්‍රදේශය තුළ නේවාසික ආයතනික ඒකක විසින් නිපදවන ලද සියලු භාණ්ඩ හා සේවාවන්ගේ මුදල්මය වටිනාකමයි.
(2) ආර්ථික ප්‍රදේශය තුළ නේවාසික ආයතනික ඒකක විසින් නිපදවන ලද සියලු භාණ්ඩ හා සේවාවන්ගේ මුදල්මය වටිනාකම + නිෂ්පාදිතය මත ශුද්ධ බදු වේ.
(3) මූලික මිල යටතේ නිෂ්පාදිතයේ දළ වටිනාකම + නිෂ්පාදිතය මත අනෙකුත් ශුද්ධ බදු වේ.
(4) ප්‍රාථමික ආදායම්වල එකතුව - ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය වේ.
(5) මූලික මිල යටතේ නිමැවුමේ දළ වටිනාකම - ගැනුම්කරුගේ මිල යටතේ අතරමැදි පරිභෝජනය වේ.

**19.** ආදායම් ප්‍රවේශයට අනුව වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ අගය වනුයේ,

(1) සේවක ආදායම් + දළ මෙහෙයුම් අතිරික්තය + මිශ්‍ර ආදායම් + නිෂ්පාදනය මත අනෙකුත් බදු - නිෂ්පාදනය මත අනෙකුත් සහනාධාර + නිෂ්පාදිතය මත ශුද්ධ බදු ය.

(2) සේවක ආදායම් + ශුද්ධ මෙහෙයුම් අතිරික්තය + මිශ්‍ර ආදායම් + නිෂ්පාදනය මත අනෙකුත් බදු - නිෂ්පාදනය මත අනෙකුත් සහනාධාර + නිෂ්පාදිතය මත ශුද්ධ බදු ය.

(3) සේවක ආදායම් + දළ මෙහෙයුම් අතිරික්තය + මිශ්‍ර ආදායම් + නිෂ්පාදනය මත අනෙකුත් බදු - නිෂ්පාදනය මත අනෙකුත් සහනාධාර ය.

(4) සේවක ආදායම් + දළ මෙහෙයුම් අතිරික්තය + නිෂ්පාදනය මත අනෙකුත් බදු - නිෂ්පාදනය මත අනෙකුත් සහනාධාර ය.

(5) සේවක ආදායම් + දළ මෙහෙයුම් අතිරික්තය + මිශ්‍ර ආදායම් + නිෂ්පාදිතය මත ශුද්ධ බදු ය.

**20.** දෙන ලද වර්ෂයක, කිසියම් රටක ප්‍රාග්ධන සම්පාදනයට ඇතුළත් වන ඇතැම් අයිතම පහත වගුවේ පෙන්නුම් කෙරේ.

| අයිතමය | වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|
| පදිංචි නිවාස, ගොඩනැගිලි හා වෙනත් ඉදි කිරීම් | 5000 |
| යන්ත්‍ර සහ උපකරණ | 1000 |
| කිරි ගවයින් | 100 |
| පරිගණක මෘදුකාංග සහ දත්ත පද්ධති | 200 |
| ඉඩම් සංවර්ධනය | 400 |
| ස්වාධිකාර සහ බලපත්‍ර අත්කර ගැනීම් | 300 |
| පරිලේඛන වෙනස් වීම් | 150 |
| වටිනා දෑ අත්කර ගැනීම් - අත් හැරීම් | 50 |
| නිමි භාණ්ඩ හා අමුද්‍රව්‍ය | 50 |

මෙම රටේ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය සහ දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය පිළිවෙළින් රුපියල් මිලියන

(1) 7200 සහ 7500 ක් වේ. (2) 7200 සහ 7000 ක් වේ. (3) 6700 සහ 6650 ක් වේ.
(4) 7250 සහ 7200 ක් වේ. (5) 7000 සහ 7200 ක් වේ.

**21.** ජාතික ගිණුම් සැකසීමේ දී නිෂ්පාදන ඉමෙන් බැහැර කෙරෙනුයේ පහත සඳහන් ඒවා අතුරින් කවරක් ද?

(1) ගෘහ ඒකක විසින් ස්ව පරිභෝජනය සඳහා කෘෂිකාර්මික බෝග වගා කිරීම.
(2) ගෘහ ඒකක විසින් තම සාමාජිකයන්ට ප්‍රවාහන පහසුකම් සැපයීම.
(3) ස්වේච්ඡා ශ්‍රමය මගින් නිපදවූ භාණ්ඩ හා සේවා.
(4) කොටස් වෙළෙඳපොළෙහි තැරැව්කරුවන් විසින් උපයා ගනු ලැබූ කොමිස් ගාස්තු.
(5) බැංකු තැන්පතු සඳහා තැන්පතු හිමියන් විසින් උපයා ගනු ලැබූ පොළී ආදායම්.

**22.** කිසියම් කල්පිත ආර්ථිකයක ජාතික ගිණුම් සඳහා අදාළ දත්ත සමහරක් පහත වගුවේ දැක්වේ.

| අයිතමය | වටිනාකම (රුපියල් බිලියන) |
|---|---|
| දළ දේශීය නිෂ්පාදිතය | 10,000 |
| පෞද්ගලික පරිභෝජනය | 6400 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 1600 |
| ශුද්ධ අපනයන | -500 |

මෙම ආර්ථිකයේ රාජ්‍ය පරිභෝජනය සහ දේශීය ඉතුරුම්වල අගයන් කොපමණ ද?

| | රාජ්‍ය පරිභෝජනය (රුපියල් බිලියන) | දේශීය ඉතුරුම් (රුපියල් බිලියන) |
|---|---|---|
| (1) | 2000 | 1000 |
| (2) | 2500 | 1100 |
| (3) | 2500 | 2100 |
| (4) | 2600 | 1200 |
| (5) | 3000 | 1100 |


**23.** පරිභෝජන ශ්‍රිතය 45° රේඛාවට පහළින් පවතින විට කුටුම්බ,

(1) වැඩිවන ආදායම මුළුමනින්ම වියදම් කරයි.
(2) ඔවුන්ගේ වැය කළ හැකි ආදායමට වඩා පරිභෝජනය කරයි.
(3) ඔවුන්ගේ වැය කළ හැකි ආදායමෙන් කොටසක් ඉතිරි කරයි.
(4) වැඩිවන ආදායම මුළුමනින්ම ඉතිරි කරයි.
(5) නිර් ඉතුරුම්වල යෙදේ.

**24.** රජයේ කටයුතු නොමැති ආවෘත ආර්ථිකයක, රුපියල් මිලියන 200 කින් ආයෝජන ඉහළ යන විට, රුපියල් මිලියන 800 කින් ආදායම වැඩි වන්නේ නම්, මෙම ආර්ථිකයේ ආන්තික පරිභෝජන නැඹියාව (MPC)

(1) 0.80 කි. (2) 0.75 කි. (3) 0.70 කි.
(4) 0.65 කි. (5) 0.60 කි.

**25.** කිසියම් ආර්ථිකයක කෙටි කාලීන සමාහාර සැපයුම් වක්‍රය හා සමාහාර ඉල්ලුම් වක්‍ර පහත රූප සටහන පෙන්වයි.




සමාහාර ඉල්ලුම් වක්‍රය $AD_1$ සිට $AD_2$ දක්වා විතැන් වීම පහත සඳහන් කවරක් මගින් පැහැදිළි කළ හැකි ද?

(1) පොළී අනුපාතිකයේ ඉහළ යාමක් (2) රජයේ වියදම් ඉහළ යාමක්
(3) ශුද්ධ අපනයන ඉහළ යාමක් (4) උද්ධමන අනුපාතිකයේ අඩු වීමක්
(5) බදු අඩු වීමක්

**26.** කුටුම්බ විසින් වත්කමක් ලෙස මුදල් සඳහා කරනු ලබන ඉල්ලුම වැඩි වන්නේ,

(1) නාමික දළ දේශීය නිෂ්පාදිතය පහළ වැටෙන විට ය.
(2) නාමික දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යන විට ය.
(3) පිළිණපත් මිල පහළ යන විට ය.
(4) මුදල් සැපයුම පහළ යන විට ය.
(5) නාමික පොළී අනුපාතිකය පහළ යන විට ය.

**27.** ගනුදෙනුකරුවෙකු තම බැංකු ගිණුමෙන් රු. 50,000 ක මුදල් ආපසු ගනු ලැබේ යැයි සලකන්න. 20% ක ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයක් පවතින අතර අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී නම් මෙම ගනුදෙනුව සෘජුවම,

(1) මුදල් සැපයුම රු. 50,000 කින් පහළ හෙළයි. (2) බැංකු තැන්පතු රු. 50,000 කින් පහළ හෙළයි.
(3) මුදල් සැපයුම රු. 250,000 කින් පහළ හෙළයි. (4) බැංකු තැන්පතු රු. 250,000 කින් පහළ හෙළයි.
(5) බැංකු තැන්පතු රු. 200,000 කින් පහළ හෙළයි.

**28.** මහ බැංකුව විසින් විවෘත වෙළෙඳපොළෙහි රජයේ සුරැකුම්පත් අලෙවිකරනු ලැබුව හොත්,

(1) වාණිජ බැංකු සංචිත ඉහළ යන අතර අධි බලැති මුදල් තොගය ද ඉහළ යයි.
(2) වාණිජ බැංකු සංචිත අඩු වන අතර අධි බලැති මුදල් තොගය ද අඩුවේ.
(3) වාණිජ බැංකු සංචිත ඉහළ යන අතර අධි බලැති මුදල් තොගය පහළ යයි.
(4) වාණිජ බැංකු සංචිත අඩු වන අතර අධි බලැති මුදල් තොගය ඉහළ යයි.
(5) වාණිජ බැංකු සංචිත අඩු වන අතර බැංකු සතුව අධි සංචිත පවතී නම් මුදල් සැපයුම ඉහළ යයි.

**29.** ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තියක් යොදා ගැනීමෙන් පොලී අනුපාතිකය, පෞද්ගලික ආයෝජනය, සමාහාර ඉල්ලුම,සහ දේශීය නිෂ්පාදිතය මත කෙබඳු බලපෑමක් අපේක්ෂා කෙරේ ද?

| | පොලී අනුපාතිකය | පෞද්ගලික ආයෝජනය | සමාහාර ඉල්ලුම | දේශීය නිෂ්පාදිතය |
|---|---|---|---|---|
| (1) | පහත හෙළීම | ඉහළ නැංවීම | ඉහළ නැංවීම | ඉහළ නැංවීම |
| (2) | පහත හෙළීම | ඉහළ නැංවීම | ඉහළ නැංවීම | පහත හෙළීම |
| (3) | ඉහළ නැංවීම | ඉහළ නැංවීම | ඉහළ නැංවීම | පහත හෙළීම |
| (4) | ඉහළ නැංවීම | පහත හෙළීම | ඉහළ නැංවීම | ඉහළ නැංවීම |
| (5) | පහත හෙළීම | ඉහළ නැංවීම | පහත හෙළීම | පහත හෙළීම |

**30.** බැංකු පද්ධතිය තුළ ක්‍රියා කරන එක් වාණිජ බැංකුවක ශේෂ පත්‍රය පහත දැක්වේ,

| වගකීම් | (රු. මිලියන) | වත්කම් | (රු. මිලියන) |
|---|---|---|---|
| තැන්පතු | 100,000 | සංචිත මුදල් | 24,000 |
| | | සුරැකුම්පත් | 36,000 |
| | | ණය | 40,000 |
| එකතුව | 100,000 | එකතුව | 100,000 |

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20%ක් වේ නම්, මෙම බැංකුවට අලුත් ණය උපරිම වශයෙන් කෙතරම් ප්‍රමාණයක් ලබා දිය හැකි ද?

(1) රුපි. මි. 2,000.
(2) රුපි. මි. 4,000.
(3) රුපි. මි. 8,000.
(4) රුපි. මි. 14,000.
(5) රුපි. මි. 20,000.

**31.** පොදු භාණ්ඩයක් සම්බන්ධයෙන් එකඟ විය හැකි ප්‍රකාශය වන්නේ එය,

(1) සුවිශේෂ වශයෙන් ම රජය විසින් එහි ආවස්ථික පිරිවැයට වඩා අඩු මිලකට සපයනු ලබයි.
(2) සුවිශේෂ වශයෙන් පෞද්ගලික අංශය විසින් එහි වෙළෙඳපොළ මිලට වඩා අඩු මිලකට සපයනු ලබයි.
(3) පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශය යන දෙඅංශය විසින් ම එහි වෙළෙඳපොළ මිලට වඩා අඩු මිලකට සපයනු ලබයි.
(4) එක් අයෙකුගේ පරිභෝජනය නිසා සෙසු අයගේ පරිභෝජනය අහිමි නො කරයි.
(5) නිෂ්පාදනයේ දී ආවස්ථික පිරිවැයක් හට නො ගනී.

**32.** වෙළෙඳපොළ අසමත්වීම් යනු,

(1) වෙළෙඳපොළ ඉල්ලුම හා සැපයුම සමාන නො වන තත්ත්වයකි.
(2) වෙළෙඳපොළ විසින් සම්පත් කාර්යක්ෂමව බෙදා වෙන් නො කරන තත්ත්වයකි.
(3) ආර්ථික ලාභ ශූන්‍ය වන විට නිෂ්පාදන ආයතන කර්මාන්ත අතහැර දමා යන තත්ත්වයකි.
(4) මධ්‍යගත සැලසුම් අර්ථ ක්‍රමවල පමණක් දක්නට ලැබෙන තත්ත්වයකි.
(5) රජයේ බදු පැනවීම නිසා ආර්ථික අතිරික්තය පහළ වැටෙන තත්ත්වයකි

**33.** එක්තරා නේවාසික නිවාස ව්‍යාපෘතියකට අදාළ ප්‍රතිලාභ හා පිරිවැය දත්ත පහත වගුවේ දැක්වේ. (වටිනාකම රුපියල් මිලියනවලිනි.)

| | | | |
|---|---|---|---|
| පෞද්ගලික ප්‍රතිලාභ | 800 | පෞද්ගලික පිරිවැය | 500 |
| බාහිර ප්‍රතිලාභ | 100 | බාහිර පිරිවැය | 150 |

ඉහත වගුවට අනුව නිගමනය කළ හැක්කේ,

(1) සමාජ ප්‍රතිලාභ රුපියල් මිලියන 100ක් බව ය.
(2) සමාජ පිරිවැය රුපියල් මිලියන 250ක් බව ය.
(3) සමාජ ප්‍රතිලාභ රුපියල් මිලියන 1,300ක් බව ය.
(4) සමාජ ප්‍රතිලාභ ඉක්මවූ සමාජ පිරිවැයක් පවතින බව ය.
(5) සමාජ පිරිවැය ඉක්මවූ සමාජ ප්‍රතිලාභ පවතින බව ය.

**34.** පහත දැක්වෙන ලක්ෂණ අතුරින් ප්‍රතික්‍රමික බදු ව්‍යුහයක ලක්ෂණයක් වනුයේ කුමක් ද?

(1) සියලු ම ආදායම් මට්ටම්වල දී ආදායමෙන් සමාන ප්‍රතිශතයක් බදු වශයෙන් ගෙවනු ලැබේ.
(2) පහළ ආදායම් උපයන්නන්ගෙන් ගනු ලබන බදු ප්‍රතිශතයට වඩා ඉහළ ආදායම් උපයන්නන්ගෙන් ගනු ලබන බදු ප්‍රතිශතය අඩුය.
(3) පහළ ආදායම් උපයන්නන්ගෙන් ගනු ලබන බදු ප්‍රමාණයට වඩා ඉහළ ආදායම් උපයන්නන්ගෙන් ගනු ලබන බදු ප්‍රමාණය වැඩිය.
(4) අඩු ආදායම් උපයන්නන් ගෙවන බදු ප්‍රමාණයට වඩා ඉහළ ආදායම් උපයන්නන් ගෙවන බදු ප්‍රමාණය වැඩිය.
(5) ආදායම් මට්ටම ඉහළ යන විට ගෙවනු ලබන බදු ප්‍රතිශතය ද ඉහළ යයි.

**35.** මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ බදු අයභාරය හා දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය පහත වැටීමට හේතුවක් **නො වූයේ** පහත සඳහන් කවරක් ද?

(1) සෘජු විදේශ ආයෝජන ආකර්ශණය කර ගැනීමට බදු සහන ලබා දීම.
(2) රජයේ කෙටි කාලීන මුදල් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා බදු ක්‍රමයේ සිදු කළ අක්‍රමවත් වෙනස් කිරීම්.
(3) බදු පැහැර හැරීම හා බදු දැලෙන් පලායාම් සහිත විශාල නොවිධිමත් ආර්ථිකයක් පැවතීම.
(4) රාජ්‍ය වියදම් මූල්‍යනය කිරීම සඳහා විදේශ ණය මත රඳා පැවැත්ම ඉහළ යාම.
(5) බදු නීති සංකීර්ණ වීම සහ බදු වර්ග විශාල සංඛ්‍යාවක් පැවතීම නිසා බදු පරිපාලනය අකාර්යක්ෂම වීම.

**36.** දේශීය පිඟන් භාණ්ඩ නිෂ්පාදකයෙකු රු. 1,000ක් වටිනා ආනයන යෙදවුම් භාවිත කොට නිෂ්පාදනය කළ තේ පෝච්චියක් රු. 3,000 කට දේශීය වෙළෙඳපොළේ අලෙවි කරයි. ඒ හා සමාන වූ ආනයනය කළ තේ පෝච්චියක් නිර්බාධ දේශීය වෙළෙඳපොළේ තීරු බදු රහිතව රු. 3,000කට අලෙවි කරයි. ආනයනය කළ තේ පෝච්චි මත 20% ක තීරු බද්දක් පැනවූයේ නම් සඵල ආරක්ෂණ අනුපාතිකය

(1) 15% කි. (2) 20% කි. (3) 28% කි.
(4) 30% කි. (5) 33.3% කි.

**37.** ශ්‍රී ලංකාවේ භාණ්ඩ වෙළෙඳ අනුපාතයේ වාසිදායක වෙනසකට හේතුවක් ලෙස දැක්විය හැක්කේ,

(1) අවශේෂ ලෝකය වෙත කෙරෙන ශ්‍රී ලංකාවේ අපනයන පහත වැටීම ය.
(2) වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ බාහිර අගය පහත වැටීම ය.
(3) ශ්‍රී ලංකාවේ වෙළෙඳ ශේෂයේ අතිරික්තයක් පැවතීම ය.
(4) ශ්‍රී ලංකාවේ අපනයන මිලට සාපේක්ෂව ආනයන මිල පහත වැටීම ය.
(5) ශ්‍රී ලංකාවේ ආනයන වියදමට සාපේක්ෂව අපනයන ඉපැයීම් ඉහළ යාම ය.

**38.** ආනයන මත කෝටාවන් **(Quota)** පැනවීමේ ප්‍රතිවිපාකයක් වශයෙන් පහත සඳහන් කවරක් සිදු වෙතැයි පුරෝකථනය කළ හැකි වේද?

(1) තරගකාරිත්වය ඉහළයාම සහ පාරිභෝගික මිල පහළ යාම.
(2) ආනයන භාණ්ඩවලින් ලැබෙන රාජ්‍ය අයභාරය ඉහළ යාම.
(3) ශුද්ධ අපනයන ඉහළ යාම සහ සමාහාර සැපයුම ඉහළ යාම.
(4) පාරිභෝගික මිල ගණන් පහළ වැටීම සහ සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ යාම.
(5) පාරිභෝගික මිල ගණන් ඉහළ යාම සහ සම්පත් බෙදා වෙන් කිරීම අකාර්යක්ෂම වීම.

**39.** ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලන ලේඛනයේ වෙළෙඳ ගිණුමේ බැර අයිතමයක් වශයෙන් සටහන් වන්නේ පහත ගනුදෙනු අතරින් කුමන ගනුදෙනුව ද?

(1) ශ්‍රී ලාංකික සංචාරකයෙක් ඇමෙරිකාවේ සංචාරය කරමින් $ 2,000ක් වැය කිරීම.

(2) මැලේසියානු සමාගමක් විසින් ශ්‍රී ලංකාවේ ජංගම දුරකථන සමාගමක $ 10,000ක් වටිනා කොටස් මිල දී ගැනීම.

(3) සිංගප්පූරු ආයෝජකයෙකු විසින් $ 5000 ක් ගෙවා ශ්‍රී ලංකා රජයේ බැඳුම්කර මිල දී ගැනීම.

(4) ශ්‍රී ලංකා රජය විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගත් $ මිලියන 5,000ක ණය වාරිකයක් ආපසු ගෙවීම.

(5) රුසියානු සුපිරි වෙළෙඳසැල් ජාලයක් විසින් $ 8,000ක් ගෙවා ශ්‍රී ලංකාවෙන් තේ තොගයක් මිල දී ගැනීම

**40.** කල්පිත ආර්ථිකයක ගෙවුම් තුලන ලේඛනයට අදාළ දත්ත සමහරක් පහත වගුවේ දැක් වේ.

| අයිතමය | වටිනාකම (රු.මිලියන) |
|---|---|
| අපනයන | 12,000 |
| ආනයන | 15,000 |
| සේවා (ශුද්ධ) | 500 |
| ප්‍රාථමික ආදායම් (ශුද්ධ) | 1,000 |
| ද්විතියික ආදායම් (ශුද්ධ) | 500 |
| ප්‍රාග්ධන සංක්‍රාම ශුද්ධ | 400 |

මෙම ආර්ථිකයේ ජංගම ගිණුමේ ශේෂය රුපියල් මිලියන

(1) 600ක හිඟයකි. (2) 1000ක හිඟයකි. (3) 3000ක හිඟයකි.
(4) 1000ක අතිරික්තයකි. (5) 3000ක අතිරික්තයකි.

**41.** ශ්‍රී ලංකාවේ රුපියලෙහි අගය ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව පහළ යාමක දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය මත කෙබඳු බලපෑමක් ඇති කෙරේ ද?

(1) ආනයන ඉල්ලුම ඉහළ යාම සහ අපනයන ඉල්ලුම පහළ යාම.

(2) ආනයන ඉල්ලුම පහළ යාම සහ අපනයන ඉල්ලුම ඉහළ යාම.

(3) ආනයන සහ අපනයන ඉල්ලුම යන දෙක ම ඉහළ යාම.

(4) අපනයන මිල සහ ආනයන මිල යන දෙක ම පහළ යාම.

(5) ආනයන මිල සහ අපනයන මිල යන දෙක ම ඉහළ යාම.

**42.** ලෝක වෙළෙඳ සංවිධානයේ ප්‍රධාන අරමුණ වනුයේ,

(1) ගෝලීය මූල්‍ය ස්ථායීතාව රැක ගැනීම ය.

(2) ගෝලීය දරිද්‍රතාවය මුලිනුපුටා දැමීම ය.

(3) තිරසාර සංවර්ධනය අත්කර ගැනීම ය.

(4) සාමාජික රටවල ගෙවුම් ශේෂ ප්‍රශ්න විසඳීම ය.

(5) බහු පාර්ශ්වීය වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම ය.

**43.** ආර්ථික වෘද්ධිය වඩාත් හොඳින් විස්තර කෙරෙනුයේ,

(1) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය දකුණට විතැන්වීමක් සහ ස්වභාවික සේවා වියුක්ති අනුපාතිකය ඉහළ යාමක් ලෙස ය.

(2) නිෂ්පාදන හැකියා මායිම දකුණට විතැන්වීමක් සහ දිගු කාලීන සමාහාර සැපයුම් වක්‍රය වමට විතැන්වීම ක් ලෙස ය.

(3) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට විතැන්වීමක් සහ දිගු කාලීන සමාහාර සැපයුම් වක්‍රය දකුණට විතැන්වීමක් ලෙස ය.

(4) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට විතැන්වීමක් සහ දිගු කාලීන සමාහාර සැපයුම් වක්‍රය වමට විතැන්වීම ක් ලෙස ය.

(5) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය දකුණට විතැන්වීමක් සහ දිගු කාලීන සමාහාර සැපයුම් වක්‍රය දකුණට විතැන්වීම ක් ලෙස ය.

**44.** 2015 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුනාගත් තිරසාර සංවර්ධන අභිමතාර්ථයක් **නො වනුයේ** පහත සඳහන් ඈ අතුරින් කවරක් ද?

(1) සෑම තැන ම සහ සෑම ස්වරූපයක ම දරිද්‍රතාව මුලිනුපුටා ඇමීම.
(2) දේශගුණික වෙනස්කම් සහ එහි බලපෑම් මැඩලීමට කඩිනම් ක්‍රියා මාර්ග ගැනීම.
(3) සාගින්න නැති කිරීම සහ ආහාර සුරක්ෂිතතාව අත්කර ගැනීම හා තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.
(4) රටක ඇතුළත මෙන් ම රටවල් අතර අසමානතා අඩු කර ගැනීම.
(5) සැමට ප්‍රාථමික අධ්‍යාපනය ලබා දීම.

**45.** රටවල් ආර්ථික වශයෙන් සැසඳීම සහ වර්ගීකරණය කිරීම සඳහා ලෝක බැංකුව විසින් යොදා ගන්නා නිර්ණායකය වන්නේ කුමක් ද?

(1) ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම
(2) ක්‍රය ශක්ති සාම්‍යය අනුව ගළපන ලද ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම
(3) ක්‍රය ශක්ති සාම්‍යය අනුව ගළපන ලද ප්‍රතිශීර්ෂ දළ දේශීය ආදායම
(4) ප්‍රතිශීර්ෂ දළ දේශීය නිෂ්පාදිතය
(5) ප්‍රතිශීර්ෂ ශුද්ධ ජාතික ආදායම

**46.** 2016 දී සිදු කළ ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයේ ආංශික සංයුතිය නිවැරදිව දක්වා ඇත්තේ කවර දත්ත පෙළකින් ද?

| | ජනගහන දරිද්‍රතා දර්ශකය - (HCI) | | |
|---|---|---|---|
| | නාගරික අංශය (%) | ග්‍රාමීය අංශය (%) | වතු අංශය (%) |
| (1) | 2.1 | 7.6 | 10.9 |
| (2) | 4.5 | 10.2 | 16.3 |
| (3) | 4.2 | 7.5 | 10.6 |
| (4) | 1.9 | 4.3 | 8.8 |
| (5) | 3.1 | 7.9 | 10.2 |

**47.** කිසියම් කල්පිත ආර්ථිකයක කුටුම්බ මධ්‍යන මාසික ආදායම සහ මුළු ආදායමෙන් ලබා ගන්නා ප්‍රතිශත පිළිබඳ පංචමක ව්‍යාප්තියට අදාළ දත්ත පහත වගුවේ දැක්වේ.

| අයිතමය | කුටුම්බ ආදායම් පංචමක ව්‍යාප්තිය | | | | |
|---|---|---|---|---|---|
| | 1 වන පංචමකය | 2 වන පංචමකය | 3 වන පංචමකය | 4 වන පංචමකය | 5 වන පංචමකය |
| මධ්‍යන මාසික කුටුම්බ ආදායම (රු.) | 15,000 | 30,000 | 45,000 | 65,000 | 160,000 |
| ආදායම් ප්‍රතිශතය (%) | 4.8 | 9.6 | 14.0 | 20.7 | 50.8 |

මෙම ආර්ථිකයේ පංචමක අපකිරණ අනුපාතය වනුයේ,

(1) 10.6. (2) 12.0. (3) 15.4.
(4) 18.0. (5) 22.0.

**48.** කිසියම් කල්පිත රටක් සඳහා අදාළ ප්‍රජා විද්‍යාත්මක දත්ත කිහිපයක් පහත දැක්වේ.

| **අයිතමය** | **සංඛ්‍යාව (මිලියනවලින්)** |
|---|---|
| මුළු ජනගහනය | 250 |
| ජනගහනය (අවුරුදු 15 සහ ඊට වැඩි) | 200 |
| සේවා නියුක්ත ජනගහනය | 80 |
| සේවා වියුක්ත ජනගහනය | 20 |

ඉහත තොරතුරු අනුව අදාළ රටෙහි සේවා වියුක්ති අනුපාතිකය සහ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?

| | සේවා වියුක්ති අනුපාතිකය | ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය |
|---|---|---|
| (1) | 15% | 60% |
| (2) | 20% | 50% |
| (3) | 25% | 75% |
| (4) | 55% | 80% |
| (5) | 80% | 45% |

**49.** ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති අතුරින් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව (PPP) ක්‍රමවේදය යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිය කුමක් ද?

(1) මාගම්පුර වරාය.
(2) මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපොළ
(3) දක්ෂිණ අධිවේගී මාර්ගය
(4) මොරගහකන්ද ජලාශය
(5) කොළඹ දකුණු බහාලුම් පර්යන්තය

**50.** මැදි ආදායම් උගුල පිළිබඳ සංසිද්ධිය නිවැරදිව අර්ථ දැක්වෙන්නේ පහත සඳහන් කවර ප්‍රකාශය මගින් ද?

(1) මැදි ආදායම් රටක් බවට පත් වීම සඳහා කෘෂිකාර්මික අංශයේ සිට වේගවත් පරිවර්තනයක් වීමටත්, නිෂ්පාදන කර්මාන්ත අංශයේ වේගවත් වර්ධනයක් වීමටත්, අඩු ආදායම්ලාභී රටවල් අසමත් වීම.
(2) අඩු ඵලදායීතාව, අඩු ඉතුරුම් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් අඩු ආයෝජන නිසා රටවල් අඩු ආදායම් මට්ටම්වල දිගුකාලීනව හිරවී සිටීම.
(3) ගෝලීයකරණය මගින් පිරිනමා ඇති අවස්ථා අතුරින් අවම ධාරිතා මට්ටමවත් ළඟා කර ගැනීමට මැදි ආදායම් ලබන රටවල නිෂ්පාදන ආයතන අසමත් වීම.
(4) මේ දක්වා වේගයෙන් වර්ධනය වූ ආර්ථිකයන් එක තැන රැඳී සිටීම සහ ඉහළ ආදායම් රටවල තත්ත්වයට ළඟා වීමට අසමත්වීම.
(5) අධික ලෙස ණය ලබා ගත් මැදි ආදායම් රටවල්, ණය ආපසු ගෙවීම සඳහා නැවත නැවතත් ණය ලබා ගැනීමට සිදුවන තත්ත්වය.

* * *

# (21) ආර්ථික විද්‍යාව

## II පත්‍රය

උපදෙස්:

* 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

### 'අ' උප කොටස

**මෙම කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරා ගන්න.**

**1.** (i) "නිෂ්පාදනයට යොදා ගනු ලබන සියලු ම සම්පත්, ආර්ථික සම්පත් වේ". මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නෙහි ද? ඔබේ පිළිතුර හේතු සහිතව පැහැදිළි කරන්න. (ලකුණු 04)

(ii) A හා B යන විකල්ප ආර්ථික පද්ධති දෙකක් පිළිබඳව ඇතැම් තොරතුරු පහත දැක් වේ.

| **A ආර්ථික පද්ධතිය** | **B ආර්ථික පද්ධතිය** |
|---|---|
| පෞද්ගලික දේපළ හිමිකම | පොදු දේපළ හිමිකම |
| පෞද්ගලික ව්‍යවසාය | රාජ්‍ය ව්‍යවසාය |
| තරගකාරිත්වය ඉහළ මට්ටමක පැවතීම | තරගකාරිත්වයක් නො පැවතීම |

(අ) A හා B යන ආර්ථික පද්ධතින් හි තීරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණ කවරේ ද? (ලකුණු 02)

(ආ) 'කා සඳහා නිෂ්පාදනය කරනු ලැබේ ද' යන මූලික ආර්ථික ප්‍රශ්නයට මෙම ආර්ථික පද්ධති විසඳුම් සොයන ආකාරය දක්වන්න. (ලකුණු 02)

(iii) සමාජයීය වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක 'සමාජ සාධාරණත්වය' තහවුරු කිරීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේ ද? (ලකුණු 04)

(iv) පහත සඳහන් දෑ නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර මගින් නිරූපණය කරන්න.

(අ) ආර්ථිකයට විදේශ ආයෝජන ගලා ඒම
(ආ) අත්කරගත නො හැකි නිෂ්පාදන සංයෝගයක්
(ඉ) සම්පත් ඌන උපයෝජනය
(ඊ) ආර්ථික වෘද්ධිය (ලකුණු 04)

(v) ආර්ථික කාර්යක්ෂමතාව අත්කර ගැනීම සඳහා සපුරා ගත යුතු කොන්දේසි විස්තර කරන්න. (ලකුණු 04)

**2.** (i) සාමාන්‍ය භාණ්ඩයක ඉල්ලුම අඩු වීමට බලපාන සාධක කවරේ ද? (ලකුණු 04)

(ii) X, Y, Z යන භාණ්ඩවලට අදාළ නම්‍යතා අගයන් කිහිපයක් පහත දැක් වේ.

X භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාව = + 0.2
X හා Y භාණ්ඩ අතර හරස් මිල ඉල්ලුම් නම්‍යතාව = + 1.5
Z භාණ්ඩයේ ආදායම් ඉල්ලුම් නම්‍යතාව = -1.0
ඉහත දත්ත පදනම් කර ගනිමින් X, Y සහ Z භාණ්ඩ වර්ගීකරණය කරන්න. (ලකුණු 03)

(iii) කිසියම් භාණ්ඩයක සැපයුම අනම්‍ය වීමට බලපාන සාධක කවරේ ද? (ලකුණු 03)

(iv) තරගකාරී වෙළෙඳපොළක අලෙවි වන එක්තරා භාණ්ඩයකට අදාළ ඉල්ලුම් ප්‍රමාණ හා අධි ඉල්ලුම් ප්‍රමාණ පහත වගුවෙහි දැක් වේ.

| මිල (රු) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) | අධි ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| 10 | 500 | 400 |
| 50 | 100 | - 400 |

(අ) ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර සරල රේඛීය යැයි උපකල්පනය කොට, ප්‍රස්තාර සටහනක් මගින් සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 04)

(ආ) සමතුලිත මිලේ දී සැපයුමේ මිල නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 02)

(ඇ) ඒකක 200 දී අධි ඉල්ලුම් මිල හා ඒකක 500 දී අධි සැපයුම් මිල ගණනය කරන්න. (ලකුණු 02)

(ඈ) සමතුලිත මිලේදී ආර්ථික අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 02)

**3.** (i) යෝග්‍ය රූප සටහන් යොදා ගනිමින් නිෂ්පාදකයන් මත පැනවෙන විශේෂිත බද්දක හා වටිනාකම් බද්දක වෙනස සංක්ෂිප්තව පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ii) කෘෂිකාර්මික නිෂ්පාදනවල මිල හා ආදායම් ස්ථායීකරණය සඳහා යෝග්‍ය ප්‍රතිපත්ති නම් කොට ඒවා කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06)

(iii) කිසියම් භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළ ඉල්ලුම හා සැපයුම පහත සඳහන් සමීකරණ මගින් දී ඇතැයි සලකන්න.

$P = 8 - Q_D$ (ඉල්ලුම)

$P = 2 + Q_S$ (සැපයුම)

ඒකකයක රුපියල් මිල P නිරූපණය කරන අතර ඒකක ප්‍රමාණය කිලෝ ග්‍රෑම් දහස්වලින් Q නිරූපණය කරයි.

(a) වෙළෙඳපොළ සමතුලිතයේ දී මුළු අයභාරය ගණනය කරන්න.

(ලකුණු 02)

(b) නිෂ්පාදකයින් මත ඒකකයකට රුපියල් 2ක බද්දක් පනවා ඇතැයි සලකන්න. මෙම බද්දේ ප්‍රතිඵලයක් වශයෙන් ගැනුම්කරුවන්ගේ හා විකුණුම්කරුවන්ගේ අහිමිවන ආර්ථික අතිරික්තය ගණනය කරන්න.

(ලකුණු 02)

(iv) කිසියම් භාණ්ඩයක් සඳහා රජය අවම මිලක් නියම කරනු ලබන බව ද, එම මිල යටතේ ඇති විය හැකි අතිරික්ත සැපයුම රජය විසින් මිල දී ගැනීමට වැඩ පිළිවෙළක් යොදා ඇති බව ද සලකන්න. මෙම ප්‍රතිපත්තිය වෙළෙඳපොළ සමතුලිතය හා අහිමිවන ශුභසාධනය කෙරෙහි ඇති කරන බලපෑම රූප සටහනක් ඇඳ පැහැදිලි කරන්න.

(ලකුණු 06)

**4.** (i) කෙටි කාලීන හා දිගු කාලීන සාමාන්‍ය මුළු පිරිවැය (ATC) වක්‍ර U හැඩය ගැනීම මගින් පැහැදිලි කෙරෙන ආර්ථික මූලධර්ම මොනවා ද?

(ලකුණු 04)

(ii) පරිමාණානුකූල ඵල සහ පරිමාණානුකූල පිරිමැසුම් අතර වෙනස කුමක් දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(iii) නිෂ්පාදක අතිරික්තය සහ ආර්ථික ලාභය අතර වෙනස කුමක් ද? (ලකුණු 04)

(iv) වෙළෙඳපොළක් පූර්ණ තරගකාරී වීම සඳහා අවශ්‍ය උපකල්පන කවරේ ද? එම එක් එක් උපකල්පන වැදගත් වන්නේ ඇයි දැයි දක්වන්න.

(ලකුණු 04)

(v) පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක කෙටි කාලීන මුළු අයභාරය රු.10,000 කි. මෙම ආයතනයේ මුළු පිරිවැය (TC) සහ මුළු ස්ථාවර පිරිවැය (TFC) පිළිවෙළින් රු.12,000 ක් හා රු.4,000 ක් වේ. මෙම ආයතනය කෙටි කාලයේ දී තවදුරටත් ව්‍යාපාර කටයුතුවල නිරත වේ දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04)

**5.** (i) ව්‍යාපාර චක්‍රයක ප්‍රතිගමනාත්මක හා ප්‍රසාරණාත්මක අවධිවල ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(ii) එක්තරා ආර්ථිකයක 2017 වර්ෂය සඳහා අදාළ වන සාර්ව ආර්ථික තොරතුරු සමහරක් පහත වගුවේ දැක්වේ.

| අයිතම | වටිනාකම (රුපියල් බිලියන) |
|---|---|
| නිමැවුමේ දළ වටිනාකම (මූලික මිල මත) | 1600 |
| අතරමැදි පරිභෝජනය | 350 |
| සහනාධාර අඩු කරන ලද නිෂ්පාදිතය මත බදු | 100 |
| අවසාන පරිභෝජනය | 1200 |
| අවශේෂ ලෝකයෙන් ලැබුණු දේපොළ ආදායම් | 200 |
| අවශේෂ ලෝකයට ගෙවිය යුතු දේපොළ ආදායම් | 250 |
| අවශේෂ ලෝකයෙන් ලැබුණු වර්තන සංක්‍රාම | 250 |
| අවශේෂ ලෝකයට ගෙවිය යුතු වර්තන සංක්‍රාම | 50 |

ඉහත දත්ත ඇසුරෙන් පහත සඳහන් දෑ ඇස්තමේන්තු කරන්න.

(a) වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ලකුණු 02)

(b) වෙළෙඳපොළ මිල අනුව දළ ජාතික ආදායම (ලකුණු 01)

(c) වැයකළ හැකි දළ ජාතික ආදායම (ලකුණු 01)

(d) දළ ජාතික ඉතුරුම් (ලකුණු 02)

(iii) විවිධ රටවල ජීවන තත්ත්වයේ වෙනස්කම් මැනීමේ ලා ජාතික ආදායම් සංඛ්‍යා යොදා ගැනීමේ ප්‍රයෝජන හා සීමාවන් පෙන්වා දෙන්න. (ලකුණු 04)

(iv) කල්පිත ආර්ථිකයක් පිළිබඳ සාර්ව ආර්ථික දත්ත පෙළක් පහත දැක්වේ.

$C = 100 + 0.8Y$ (පරිභෝජන ශ්‍රිතය)
$I = 200$ (පෞද්ගලික ආයෝජනය)
$G = 75$ (රජයේ මිලදී ගැනීම්)

(a) මෙම ආර්ථිකය සඳහා ඉතුරුම් ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 02)

(b) ජාතික ආදායමේ සමතුලිත මට්ටම කොපමණද? (ලකුණු 02)

(c) මෙම ආර්ථිකයේ විභව නිමැවුම් මට්ටම රුපියල් බිලියන 2,000කි. මෙහි රජයේ මිලදී ගැනීම් රුපියල් බිලියන 50කින් ඉහළ නැංවූ විට, ඍණ හෝ ධන නිමැවුම් පරතරයේ ප්‍රමාණය කොපමණ වේ ද? (ලකුණු 02)

## 'ආ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරා ගන්න.)

**6.** (i) සමාහාර මුදල් ඉල්ලුම කෙරෙහි බලපාන සාර්ව ආර්ථික විචල්‍යයන් පෙන්වා දෙමින් ඒවා මුදල් ඉල්ලුම කෙරෙහි බලපාන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 04)

(ii) මුදල් ගුණකය සහ තැන්පතු ගුණකය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) විනිමය සමීකරණය භාවිත කරමින් මුදල් සැපයුමේ වර්ධනය සහ උද්ධමන පීඩන අතර සමීප සම්බන්ධතාවක් හට ගන්නේ කෙසේ දැයි විස්තර කරන්න. (ලකුණු 04)

(iv) රටක මූලික උද්ධමනය ඇස්තමේන්තු කිරීමේ අරමුණු පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) ශ්‍රී ලංකා මහ බැංකුව, අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළේ පොළී අනුපාතිකය ස්ථාවර කිරීමට මැදිහත්වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

**7.** (i) 'ආණ්ඩුව අසමත් වීම' යන සංකල්පයෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 02)

(ii) ආණ්ඩුවේ අසමත් වීම කෙරෙහි බලපාන හේතු මොනවා ද? (ලකුණු 03)

(iii) "කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමෙහි ලා බාහිර පිරිවැයක් හටගනු ලබන අවස්ථාවක, වෙළෙඳපොළ මගින් ලබා දෙනු ලබන විසඳුම, සාමාජයීය වශයෙන් ප්‍රශස්ත විසඳුමක් නො වේ." යෝග්‍ය ප්‍රස්තාර සටහනක් ඇසුරින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ශ්‍රී ලංකා ආණ්ඩුවේ පුනරාවර්තන වියදමෙහි ප්‍රධාන සංරචක නම් කොට, එහි මෑත කාලීන ප්‍රවණතා පෙන්වා දෙන්න. (ලකුණු 05)

(v) මෑත කාලයේ දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය මුහුණ දී ඇති ප්‍රධාන අභියෝග කවරේ ද? (ලකුණු 05)

**8.** (i) සහල් සහ රෙදිපිළි නිෂ්පාදනය කරනු ලබන X සහ Y යන රටවල් දෙකෙහි නිෂ්පාදන පිරිවැයට අදාළ දත්ත පෙළක් පහත දක්වා ඇත.

| රට | ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය ශ්‍රම පිරිවැය | |
|---|---|---|
| | සහල් නිෂ්පාදනය | රෙදිපිළි නිෂ්පාදනය |
| X | 5 | 2 |
| Y | 3 | 6 |

(අ) සහල් නිෂ්පාදනයේ නිරපේක්ෂ වාසි ඇත්තේ කිනම් රටකට ද? (ලකුණු 02)

(ආ) රෙදිපිළි නිෂ්පාදනයේ සාපේක්ෂ වාසි ඇත්තේ කිනම් රටකට ද? (ලකුණු 02)

(ඇ) අන්‍යොන්‍ය වශයෙන් වාසිදායක වෙළෙඳාමක් හට ගැනීම සඳහා සහල් ඒකකයක් රෙදි ඒකක කොපමණ ප්‍රමාණයක් සමඟ හුවමාරු විය යුතු ද? (ලකුණු 02)

(ii) ආනයන සහ අපනයන ප්‍රවාහ සීමා කිරීම හෝ වෙළෙඳ දිශානතිය වෙනස් කිරීම සඳහා හෝ රටවල් විසින් යොදා ගනු ලබන තීරු බදු නො වන වෙළෙඳ බාධක මොනවා ද? (ලකුණු 04)

(iii) විදේශීය විනිමය වෙළෙඳපොළෙහි විදේශ විනිමය සඳහා ඇති ඉල්ලුම සහ සැපයුම තීරණය කෙරෙන සාධක කවරේ ද? (ලකුණු 05)

(iv) බහු-පාර්ශ්වීය මූල්‍ය ආයතන යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02)

(v) අන්තර් ජාතික මූල්‍ය අරමුදලේ අරමුණු තුනක් නම් කරන්න. (ලකුණු 03)

**9.** (i) ආර්ථික වර්ධනය සහ ආර්ථික සංවර්ධනය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාවට ඉහළ මානව සංවර්ධනයක් අත්කර ගැනීමට ඉවහල් වී ඇති සාධක කවරේ ද? (ලකුණු 05)

(iii) ජාත්‍යන්තර දරිද්‍රතා ඉම නිර්වචනය කරන්න. වර්තමානයේ ඒවායේ අගයන් කවරේ ද? (ලකුණු 04)

(iv) ඉහළ ආර්ථික වර්ධනයක් අත්කර ගැනීමේ ලා ශ්‍රී ලංකාව අසමත් වීම කෙරෙහි බලපා ඇති හේතු කවරේ ද? (ලකුණු 06)

**10.** (i) ශ්‍රී ලංකාව පහළ මැදි ආදායම්ලාභී රටක සිට ඉහළ මැදි ආදායම්ලාභී රටක තත්ත්වය කරා ඉහළ නංවා ගැනීමේ දී මුහුණ දෙන ප්‍රධාන අභියෝග කවරේ ද? (ලකුණු 05)

(ii) ශ්‍රී ලංකා ආර්ථිකයට විදේශීය ප්‍රේෂණ කොතරම් දුරට වැදගත් වේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාව මුහුණ පා සිටින ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ කැපී පෙනෙන ලක්ෂණ සහ ඒවායේ ආර්ථික ඇඟැවුම් සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) 'නිදහස ලබා ගැනීමෙන් පසු කාලය තුළ ශ්‍රී ලංකාව අනුගමනය කොට ඇති ආර්ථික ප්‍රතිපත්ති ආරක්ෂණවාදී සහ නිර්බාධවාදී මූලෝපායන් අතර දෝලනය වීමක් පෙන්නුම් කරයි.' මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 05)

* * *